මගේ අංකය:- ක්ෂේත්‍ර ප්‍රදේශ/02/2015
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09
2015.12.07

චක්‍ර ලේඛන අංකය:- 31/2015

සියළුම බන්ධනාගාර අධිකාරීන්/ සහකාර බන්ධනාගාර අධිකාරීන් වෙත

<u>පුනරුත්ථාපන නිළධාරීන්ගේ ක්ෂේත්‍ර ප්‍රදේශ හා ක්ෂේත්‍ර රාජකාරී කටයුතු සම්බන්ධව</u>

උක්ත මැයෙන් නිකුත් කර ඇති 18/2015 - 2015.07.21 දාතම චක්‍රලේඛන මින් අවලංගු කරමි.

01.නවක පුනරුත්ථාපන නිළධාරීන්, බන්ධනාගාර ආයතනයන් හා පොලිස් ස්ථාන දැනට වැඩිවී ඇති බැවින් පුනරුත්ථාපන නිළධාරීන් සියළුම බන්ධනාගාර ආයතන වෙත අනුයුක්ත කර ඇති බැවින් බන්ධනාගාර ආයතන සඳහා පහත සඳහන් කර ඇති ලැයිස්තුවේ සඳහන් පරිදි ක්ෂේත්‍ර ප්‍රදේශ වෙන් කරදෙමි. ඔබ බන්ධනාගාරයේ පුනරුත්ථාපන නිළධාරීන් සඳහා ක්ෂේත්‍ර ප්‍රදේශ දැනටමත් වෙන් කර දී ඇති බැවින් එම ක්ෂේත්‍ර ප්‍රදේශයන්ට අයත් බලපත්‍රධාරීන්ගේ අධීක්ෂණ කටයුතුහා ක්ෂේත්‍ර වාර්ථා පිළියෙල කිරීම මෙන්ම මීට අදාළ සෙසු කාර්යයන් එම නිළධාරීන් වෙත පැවරිය යුතුය.

02.පුනරුත්ථාපන නිළධාරීන් වෙත පැවරී ඇති රාජකාරී ක්ෂේත්‍රයට අදාළව සපයන වාර්ථා, කලට වේලාවට නිවැරදිව අදාළ බන්ධනාගාර ආයතන වෙත යවා ඇත්ද යන්න පිළිබඳව අධිකාරීවරුන් සොයා බැලිය යුතුය. තවද ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීන් සහ ප්‍රධාන පුනරුත්ථාපන නිළධාරීන්ගේ අධීක්ෂණයේදී මෙම කටයුතු වල යම් ප්‍රමාදයක් සිදුව ඇතිනම් ඊට හේතුවද, ප්‍රමාද වැලැක්වීමට ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරී සහ ප්‍රධාන පුනරුත්ථාපන නිළධාරීන් ගත් පියවර පිළිබඳ සපයන වාර්ථාවේ සඳහන් කල යුතුය.

03.පුනරුත්ථාපන නිළධාරීන් විසින් සකස් කරන ලද සමාජ වාර්ථා හා සමාජ වාර්ථා ගොනු චක්‍රලේඛන අනුව දී ඇති උපදෙස්වලට අනුව හා ලබා දී ඇති පුහුණුව ප්‍රකාරව නිසි ප්‍රමිතියකින් යුතුව සකස් කල යුතුය. අඩු පාඩු වෙතොත් ඒවා සම්පූර්ණ කිරීම පිණිස ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරී හා ප්‍රධාන පුනරුත්ථාපන නිළධාරීන්ගේ මග පෙන්වීම් කල යුතු අතර නිසි ප්‍රමාදයකින් තොර වාර්ථා නැවත ක්ෂේත්‍රයට ගොස් සකස් කල යුතුව ඇත්නම් එය ස්වේච්ඡාවෙන් කිරීමට පුනරුත්ථාපන නිළධාරීන් වගබලා ගත යුතුය.

04.ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීන් නොමැති බන්ධනාගාර ආයතනයන්හි පවත්වාගෙන යනු ලබන ක්ෂේත්‍ර ගමන් රාජකාරී ලේඛනයෙහි සඳහන් කර ක්ෂේත්‍ර ගමන් රාජකාරී කටයුතු ප්‍රධාන ජේලර්, අධිකාරීවරුන්ගේ නිර්දේශය පසු එහි පිටපත් තුනක් ලබාගෙන එම ක්ෂේත්‍ර ගමන් වාර්ථා ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරී වෙත යවා එම නිළධාරීන්ගේ නිර්දේශයෙන් අනතුරුව මා වෙත එවිය යුතුය. ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන

නිලධාරීන් අධීක්ෂණයේදී අදාළ ලේඛනයේ ඔහුගේ නිර්දේශය යෙදිය යුතුය. තවද සංශෝධිත වෙතොත් එයද සටහන් කල යුතුය.

05.නිකුත් කර ඇති චක්‍රලේඛ ප්‍රකාර සෑම මසකම 15 දිනට පෙර ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරී, ප්‍රධාන පුනරුත්ථාපන නිළධාරී සහ පුනරුත්ථාපන නිළධාරීන් විසින් ඊළඟ මාසයට යෙදෙන ඉදිරි ක්‍ෂේත්‍ර ගමන් වැඩසටහන අනිවාර්යයෙන්ම පිටපත් 03 න් සමන්විතව බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත එවිය යුතුය. පසුව ලැබෙන නිවාස නිවාඩු පසු වාර්ථා, අළුතින් මුදා හරින ලද බලපත්‍රධාරීන්ගේ අධීක්ෂණය හා වෙනත් විශේෂ වාර්ථා සඳහා ක්‍ෂේත්‍රයට යෑමට සිදුවුහොත් අදාළ ලේඛණයේ සටහන් කර අධිකාරීන්ගේ අනුමැතිය ලබාගෙන ඉදිරි පියවර ගත යුතු අතර මේ පිළිබඳ බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත වාර්ථා කල යුතුය.

06.පුනරුත්ථාපන නිළධාරීන් සිය රාජකාරි ගමන්වලට අදාළ ගමන් වියදම් ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේදී එම අයදුම්පත්හි ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීන් විසින් අදාළ වාර්ථා නිසි පරිදි බන්ධනාගාර ආයතන වෙත යවා ඇති බවටද සමාජ වාර්තා ගොනුවල අදාළ සටහන් යොදා ඇති බවටද සහතික කර ඇත්නම් පමණක් මෙම ගමන් වියදම්වලට අදාළ ගෙවීම් කටයුතු කළ යුතුය. ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීන් නොමැති බන්ධනාගාරයන්හි දැනට ආයතනයේ සිටින ජ්‍යෙෂ්ඨතම පුනරුත්ථාපන නිළධාරියා විසින් මෙම සටහන් යොදා ප්‍රධාන ජේලර් සහ අධිකාරීගේ අත්සන මේ සඳහා ලබා ගත යුතුය.

07.පෙර දී ඇති උපදෙස් පරිදි බලපත්‍රධාරීන් පිළිබඳව සකස්කර ඇති ප්‍රගති වාර්ථා ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීන්ගේ නිරීක්ෂණද සටහන්ද සමඟින් සෑම කාර්තුවකම 10 දිනට පෙර බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත එවිය යුතුය.

08.පුනරුත්ථාපන නිළධාරීන් ක්‍ෂෙත්‍ර ගමන් රාජකාරි යන විට එක් මාර්ගයක් එක් පුනරුත්ථාපන නිළධාරියෙකුට වෙන් කළ යුතුය. වෙන් වෙන් වශයෙන් නොව එක දිගටම අදාළ ක්‍ෂෙත්‍ර ගමන් යෙදිය යුතුය. තවද පුනරුත්ථාපන නිළධාරීන්ට ක්‍ෂේත්‍ර ප්‍රදේශ සම්බන්ධව අධිකාරීන් නිර්දේශය සමග බන්ධනාගාර කොමසාරිස් (පුනරුත්ථාපන) වෙත යොමු කර අනුමැතිය ලබා ගත යුතුය.

09.එක් එක් බන්ධනාගාර ආයතනයන්හි පුනරුත්ථාපන නිළධාරීන්ගේ රාජකාරී කටයුතු පහත සඳහන් පරිදි ප්‍රධාන පුනරුත්ථාපන නිළධාරී සහ ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීගේ අධීක්ෂණයට භාජනය විය යුතුය.

10.පහත දක්වා ඇති පරිදි ක්‍ෂේත්‍ර ප්‍රදේශ වෙන් කර ඇති මෙම චක්‍ර ලේඛණය 2016.01.01 දින සිට ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්න.

11.එක් එක් බන්ධනාගාර ආයතනයන්හි පුනරුත්ථාපන නිළධාරීන්ගේ රාජකාරි කටයුතු පහත දැක්වෙන පරිදි ජ්‍යෙෂ්ඨ පුනරුත්ථාපන නිළධාරීන්ගේ අධීක්ෂණයට භාජනය විය යුතුය.

01 වැලිකඩ - වැලිකඩ, වැලිකඩ කාන්තා, බන්ධ. රෝහල, මැගසින්, කො.රි.බ.,

02 මහර - මහර, මීතිරිගල, කන්දෙවත්ත

03 බෝගම්බර - බෝගම්බර

04 පල්ලේකැලේ - පල්ලෙකැලේ

05 මිගමුව - මීගමුව, දළුපොත (පල්ලන්සේන)

06 අනුරාධපුර - අනුරාධපුරය, පොලොන්නරුව

07 යාපනය - යාපනය, වව්නියාව

08 මඩකලපුව - මඩකලපුව,ත්‍රිකුණාමලය

09 බදුල්ල - බදුල්ල,තල්දෙන, මොණරාගල

10 ගාල්ල - ගාල්ල, බූස්ස, මාතර

11 තංගල්ල - තංගල්ල, වීරවිල, කදුරුගස්ආර

12 වාරියපොල - වාරියපොළ, අඹේපුස්ස, කෑගල්ල, හංගිලිපොළ

13 කළුතර - කළුතර, වටරැක, කුරුවිට

<u>වෙන්කර ඇති ක්ෂේත්‍ර ප්‍රදේශ</u>

1.වැලිකඩ - අතුරුගිරිය, නුගේගොඩ, නවගමුව, හංවැල්ල, මහරගම, කොල්ලුපිටිය, කොටුව, පිටකොටුව, කෙසෙල්වත්ත, මරදාන, බොරැල්ල, නාරාහේන්පිට, මිරිහාන, කුරුදුවත්ත, වැලිකඩ, තලංගම,

2.කො.රි.බ. - බම්බලපිටිය, වැල්ලවත්ත, ගල්කිස්ස, දෙහිවල, කිරුළපන අගුලාන, කොහුවල, පිළියන්දල, බොරලැස්ගමුව, මොරටුව, මොරටුමුල්ල

3.මැගසින් - ග්‍රෑන්පාස්, කොටහේන, මට්ටක්කුලිය, මෝදර, කොම්පඤ්ඤවීදිය, මාලිගාවත්ත, දෙමටගොඩ

4.බන්ධනාගාර රෝහල - වැල්ලම්පිටිය, මුල්ලේරියාව, ගොතටුව, හිඹුටාන

5.කාන්තා අංශය - කැලණිය, පෑලියගොඩ, කිරිබත්ගොඩ

6. මහර - ගම්පහ, වැලිවේරිය, මිනුවන්ගොඩ, ජාඇල, කදාන ,වත්තල ,පමුණුගම, රාගම, නිට්ටඹුව, කඩවත, සපුගස්කන්ද, බියගම, මීගහවත්ත, ගිරිඋල්ල, දිවුලපිටිය, වේයන්ගොඩ, ගණේමුල්ල, නිකවැරටිය, කුලියාපිටිය

7.කන්දෙවත්ත/ මිතිරිගල - කිරිඳිවැල, දොම්පෙ, පූගොඩ, වීරගුල

8.මීගමුව - මීගමුව, මාදම්පේ, ආනමඩුව, පුත්තලම, කල්පිටිය, කොස්වත්ත, සීදූව, දුම්මලසූරිය

09.පල්ලන්සේන - කටුනායක, කොච්චිකඩේ, දංකොටුව, වෙන්නප්පුව, මුන්දලම, පල්ලව, හලාවත, මාරවිල, පන්නල

10.වටරැක - හෝමාගම, මොරගහහේන, කොට්ටාව, පාදුක්ක, ඉංගිරිය, අවිස්සාවේල්ල, කොස්ගම, කහතුඩුව, හොරණ,

11.කුරුවිට - රත්නපුර, ඇහැලියගොඩ, කුරුවිට, නිවිතිගල, කිරිඇල්ල, කහවත්ත, වේවැල්වත්ත, දැරණියගල, කලවාන, රක්වාන, අයගම, බලන්ගොඩ, වැලිගේපොල, ඕපනායක, කල්තොට

12.කළුතර - කළුතර උතුර /දකුණ, පයාගල, බේරුවල, මීගහතැන්න, ඉදුරුව, බෙන්තොට, මතුගම, බුලත්සිංහල, පානදුර, බදුරලිය, දොඩන්ගොඩ, වාද්දුව, අගලවත්ත,පැලවත්ත, බණ්ඩාරගම, වැලිපැන්න, අළුත්ගම, කිණියාවල

13.බෝගම්බර - තලාතුඔය, හඟුරන්කෙත, පදියපැලැල්ල, මතුරට, නිල්දණ්ඩාහින්න, තෙරිපහ, වලපනේ, කඩුගන්නාව, දවුලගල, උඩුපුස්සැල්ලෑව, රාගල, නුවරඑළිය, කඳපොළ, නානුඔය, ගිනිගත්හේන, හැටන්, මස්කෙලිය, ඩයගම, කොටගල, දිඹුල, ලිදුල, තලවාකැලේ, නෝවුඩ්, හොර්ටන්, ආගරපතන, නාවලපිටිය, මහනුවර, පේරාදෙණිය, ගම්පොළ, පුස්සැල්ලාව, ගලගෙදර, හතරලියද්දිය, මාවතගම

14.පල්ලෙකැලේ - කුන්ඩසාලේ, තෙල්දෙණිය, රංගල, හුන්නස්ගිරිය, මිනිපේ, හසලක, පොල්පිටිගම, මාතලේ, දඹුල්ල, රත්තොට, උඩුදුම්බර, මහවිල, ලග්ගල, නාවුල. අංකුඹුර, අලවතුගොඩ, වත්තේගම, අකුරන, මැණික්හින්න, ගිරිබාව, කටුගස්තොට,

15.බදුල්ල - මඩොල්සිම, ලුනුගල, නමුණුකුල, කොස්ලන්ද, වැලිමඩ, ඌවපරණගම, බදුල්ල, පස්සර, ඇල්ල, දියතලාව, හපුතලේ, හල්දුම්මුල්ල, හාලිඇල, බණ්ඩාරවෙල,ඇටම්පිටිය පූන්ඩුලුඔය,

16.තල්දෙන - කන්දෙකැටිය, මහියංගණය, ගිරාදුරුකෝට්ටේ, මීගහකිවුල, සිරිපුර, දෙහිඅත්තකණ්ඩිය, රිදීමාලියද්ද

17.මොණරාගල - මොණරාගල, බුත්තල, ගෝනගංආර, වැල්ලවාය, මැදගම, බඩල්කුඹුර, දඹගල්ල, බිබිල, දොඹගහවෙල, සියඹලාන්ඩුව, ඇතිමලේ, වඩිනාගල, තණමල්විල

18 .අනුරාධපුරය - අනුරාධපුරය, උඩමළුව, එප්පාවල, තඹුත්තේගම, මීගලෑව, තලාව, ගල්නෑව, ගල්කිරියාගම, කැකිරාව, හබරාන, තිරප්පනේ, මිහින්තලේ, කහටගස්දිගිලිය, ගලෙන්බිඳුණුවැව, හොරොව්පතාන, කැබිතිගොල්ලෑව, සිදෝගම, නොච්චියාගම, රාජාංගණය, මහවිලච්චිය, තන්තිරිමලේ, මැදවච්චිය, ,මේරගල, පදවිය, සිරිපුර, වැලිඔය

19 .ත්‍රිකුණාමලය - ත්‍රිකුණාමලය, කන්තලේ, මුතූර්, උප්පුවේලි, කුච්චවේලි, චීනවරාය, පුල්මුඩේ, සේරුවිල,සූරියපුර,සාම්පූර්,කින්නියා,තඹලගමුව,මොරවැව,ගෝමරන්කඩවල

20 .පොළොන්නරුව - පොළොන්නරුව, කදුරුවෙල, මනම්පිටිය, අරලගන්විල, වැලිකන්ද, හිගුරක්ගොඩ, මැදිරිගිරිය, බකමූන, පුලතිසිගම, මින්නේරිය, ඇලහැර, සීගිරිය

21.ගාල්ල - ගාල්ල, හබරාදූව, අහංගම, උඩුගම, නෙළුව, හිනිදුම, අක්මීමන, පෝද්දල, බද්දේගම, යක්කලමුල්ල, වදුරඹ, නාගොඩ

22.මාතර - මාතර,ගන්දර,දික්වැල්ල,තිහගොඩ,හක්මන,කුඹුරුපිටිය,මාවරල,ඌරුබොක්ක,දෙනියාය, මොරවක, අකුරැස්ස, වැලිගම, කනංකේ, පිටබැද්දර,

23.බූස්ස -මීටියාගොඩ, කොස්ගොඩ, කරන්දෙණිය, රත්ගම, හික්කඩුව, අම්බලන්ගොඩ, අහුංගල්ල, තෙලිකඩ, ඌරගහමංහන්දිය, ඇල්පිටිය, පිටිගල

24.තංගල්ල -හුංගම, අම්බලන්තොට, කුට්ටිගල, තංගල්ල, බෙලිඅත්ත, විරකැටිය, මිද්දෙනිය, වලස්මුල්ල, අගුණකොළපැලැස්ස,කටුවන

25.වීරවිල - තිස්ස,කතරගම,හම්බන්තොට,ලුණුගම්වෙහෙර

26.මඩකලපුව - කල්මුණේ, අක්කරපත්තුව, පොතුවිල්, සමන්තුරේ, තිරුක්කෝවිල්, අම්පාර, ඉගිනියාගල, දමන, උගන, මධ්‍යකදවුර, සමලකඩේ, බත්තිඇල්ල, තෙනගන්කුඩි, කළුදාවලයි, කලවංචිකුඩි, වෙල්ලවාලි, මඩකලපුව, එරාවූර්, වාලච්චේයි, කල්කුඩා, මහා ඔය,පදියතලාව, වාකරේ, පනිච්චන්කෙනි

27.කෑගල්ල - පොතුහැර, පොල්ගහවෙල, මාවනැල්ල, අරනායක, රඹුක්කන, හෙම්මාතගම, කෑගල්ල, බුලත්කොහුපිටිය, රුවන්වැල්ල, යටියන්තොට, කිතුල්ගල

28.වාරියපොළ - වාරියපොළ, කුරුණෑගල, විරඹුගෙදර, වැල්ලව, කටුපොත, අබන්පොළ, ගොකරැල්ල, නාරම්මල, හෙට්ටිපොළ, රිදිගම, කොබෙගනේ, බිංගිරිය, කොටවෙහෙර, රස්නායකපුර, ගලේවෙල

29.යාපනය - යාපනය, චුන්නාගම්, කාන්කේසන්තුරය, පේදුරුතුඩුව, කරෙයිනගර්, බටුකොට්ටේ, නාගදීපය, ඌර්කාවල්තුරෙ, චාවකච්චේරි, කොඩිකාමම්, ඉලවාලෙයි, නෙල්ලිඅඩි, වැල්වට්ටිතුරෛ, තෙලිප්පලෙයි, කෝපායි

30.වවුනියාව - වවුනියාව, කිලිනොච්චි, කනගරායකුලම්, මුලතිව්,මන්නාරම,තලෙයිමන්නාරම, නෙඩුම්කුලම්, පලෙයි, පරන්තන්, අලිමංකඩ, නෙලුම්කුලම,

31.අබේපුස්ස - අඹේපුස්ස, වරකාපොළ, දැදිගම, පිංදෙණිය, උදුන්ගොඩ, ගලිගමුව, අලව්ව, මිරිගම

32.කදුරුගස්ආර - ඇඹිලිපිටිය, උඩවලව, පනාමුරේ, සූරියවැව,සෙවනගල,කොලොන්න,ගොඩකවෙල,කුට්ටිගල

33.හංගිලිපොළ - මහව, පොල්පිටිගම, අබන්පොල, ගල්ගමුව, හිරිවැව, මිගලාව

2015.12.07
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

එච්.එම්.එන්.සී. ධනසිංහ
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය
කොළඹ 09.